# ශ්‍රී ලංකාව තුළ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තියේ භාවිතය (ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇසුරින් )

ආර්.එම්.ටී. දුලාංජලී[1] ටී.එම්.ටී.එච්. ගුණසේකර[2]
ඩබ්.එස්.එන්. හේමන්ති[3] එස්.එල්.එන්.එස්.ආර්. මධුෂිකා[4]
පී.ජී.එස්.එස්. රත්නායක[5] එම්.ඒ. විජේතුංග[6]
එම්.කේ. නදීකා දමයන්ති[7]

**සංක්ෂේපය**

රාජ්‍ය ආයතනවලින් සේවාවන් ලබා ගැනීමේ දී පුරවැසියන් විවිධ ගැටලු සහගත තත්ත්වයනට මුහුණ දෙන බව නොරහසකි. එමෙන්ම රාජ්‍ය ආයතන තුළින් සේවාලාභීන්ට සේවා සැපයීමේ දී ක්‍රියාවට නංවන ඇතැම් ක්‍රියාමාර්ග වර්තමාන සමාජ සංදර්භය සමඟ නොගැළපෙන බව ඒ සම්බන්ධයෙන් කරන ලද පූර්ව පර්යේෂණවලින් අනාවරණය කරගෙන ඇත. මෙයට විසඳුමක් ලෙස පසුගිය රජය සමයේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය හඳුන්වා දෙමින් රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීමට පියවර උත්සාහ දරන ලදී. නමුත් එය සාර්ථකව ක්‍රියාත්මක වූවා ද යන්න සැක සහිතය. එබැවින් මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය මේ වන විට ශ්‍රී ලංකාවට හඳුන්වා දී ඇතත් එය සාර්ථකව ක්‍රියාත්මක වේ දැයි යන්න සොයා බැලීමයි. ඒ සඳහා සාක්ෂරතාවයෙන්, තාක්ෂණයෙන්, නාගරිකත්වයෙන් ඉහළ මට්ටමක් පෙන්නුම් කරන ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ක්ෂේත්‍ර අධ්‍යනය සඳහා තෝරා ගැනුණි. අධ්‍යයන නියැදියට ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරින් දස දෙනෙක් අහඹු ලෙස තෝරා ගත් අතර සේවා ලබා ගැනීමට පැමිණි සේවාලාභීන් 50 දෙනෙක් ද ඇතුළත් වන සේ ප්‍රශ්නාවලියක් මඟින් දත්ත සහ තොරතුරු සපයා ගැනිණි. ලබාගත් ප්‍රමාණාත්මක තොරතුරු ප්‍රතිශත, ප්‍රස්තාර, වගු සටහන් ආදී සරල සංඛ්‍යාන විධි ක්‍රම භාවිතා කරමින් විශ්ලේෂණය කළ අතර ගුණාත්මක දත්ත සහ තොරතුරු විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. අධ්‍යයනයෙන් අනාවරණය කරගත් අන්දමට ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය මේ වන විට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තුළ ක්‍රියාත්මක වූවත්, ප්‍රතිචාරීන්ගෙන් 68%ක් ඒ සම්බන්ධයෙන් දැනුවත්භාවයක් නොමැත. තවද, එය කාර්යක්ෂම සේවයක් ලබාදීමට ඉවහල් වන බව ප්‍රතිචාරීන්ගෙන් 30% මතය වු අතර වඩා

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[6] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.
[7] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. damayanthi@kln.ac.lk

පහසු ක්‍රමවේදයක් බව 20% පැවසුවත් තවත් 24% මතය වූයේ ඒ සම්බන්ධයෙන් ආයතනය විසින් දැනුවත් භාවයක් ලබා දෙන්නේ නම් ප්‍රයෝජනවත් වන බවයි. මේ අනුව නිගමනය කළ හැකිවන්නේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව මහජනතාව තුළ දැනුවත් භාවය අඩුවීමත්, වෙබ් අඩවියේ තොරතුරු යාවත්කාලීන කිරීම සහ විද්‍යුත් තැපැල මගින් යොමු කෙරෙන විමසීම් සඳහා පිළිතුරු සැපයීම ආදී කටයුතු සඳහා කාර්යාලය තුළ වෙන් වූ නිලධාරීයෙකු නොවීමත් හේතුවෙන් මෙම ප්‍රතිපත්තිය භාවිතයට ගැනීම සම්බන්ධයෙන් ගැටලු මතු වී ඇති බවයි.

**මූඛ්‍ය පද :** *ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සේවා සැපයීමේ කාර්යක්ෂමතාව*